# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்ல
Pelawatta, Battaramulla.

මගේ අංකය / எமது இல / My No } 6/08/AL/RS/2025
ඔබේ අංකය / உமது இல / Your No } ..............................
දිනය / திகதி / Date } 2026.09. 15

දුරකථන / தொலைபேசி / Telephones } 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206,
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS — තැ.පෙ. 1503, කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O.Box 1503 Colombo
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Internet Address } www.doenets.lk
E-mail : examd@sltnet.lk


සියලු ම විදුහල්පතිවරුන් වෙත,

**<u>අ.පො.ස.(සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) සහ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය කේවල ප්‍රතිඵල සටහන් සහ සහතිකපත්‍ර සිසුන් වෙත බෙදා දීම සම්බන්ධවයි</u>**

උක්ත කරුණට අදාළව සෑම වර්ෂයකම ඉහත විභාගයන්හි ප්‍රතිඵල, සිසුන්ගේ කේවල ප්‍රතිඵල සටහන් / සහතිකපත්‍ර නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව පාසල් වෙත ලබාදීම සිදු කරනු ලබයි.

02. එසේ ඔබ වෙත එවනු ලබන කේවල ප්‍රතිඵල සටහන් නිසි පරිදි සිසුන් වෙත ලබා දී නොමැති බව විගණන පරීක්ෂණ වලදී හෙලිවී ඇත. එබැවින් ඉදිරියේදී ඔබ විසින් සිසුන් වෙත ලබාදෙනු ලබන කේවල ප්‍රතිඵල සටහන් / සහතිකපත්‍ර වලට අදාළ සංඛ්‍යාත්මක තොරතුරු විගණනය විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට සහ සංඛ්‍යාත්මක විශ්ලේෂණ සඳහා යොදා ගැනීමට නියමිතව ඇත.

03. ඒ අනුව සියලු ම විදුහල්පතිවරුන් විසින් **https://onlineexams.gov.lk** සබැඳියට පිවිස ලබාදී ඇති පරිශීලක නාම (User Name) සහ මුරපද (Password) භාවිතා කර සිසුන් වෙත ලබාදුන් ප්‍රතිඵල සටහන් / සහතිකපත්‍ර වලට අදාළ සංඛ්‍යාත්මක තොරතුරු මාසයක් ඇතුළත මාර්ගගත පද්ධතියට ඇතුළත් කළ යුතුය. එසේ ඇතුළත් කිරීමෙන් අනතුරුව බාගත කරන ලද මුද්‍රිත PDF පිටපත නිලමුද්‍රාව යොදා සහතික කර එවීමට කටයුතු කලයුතුය.

04. අ.පො.ස.(සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) සිසුන්ගේ කේවල ප්‍රතිඵල සටහන්වල පසුපිට ඔබගේ අත්සන, නිල මුද්‍රාව යොදා සහතික කර සහ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට අදාළව සිසුන්ගේ සහතික ද සිසුන් වෙත නොපමාව ලබා දිය යුතුය.

05. ඒ අනුව සිසුන්ගේ කේවල ප්‍රතිඵල සටහන්/ සහතිකපත්‍ර බෙදා නොදීම, ප්‍රමාදවීම, නිසි පරිදි දත්ත ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම විදුහල්පතිවරුන් සතුවේ.

**විමසීම :** දුරකථන අංක - 0112785922, 0112784537, 0112786616, 0112784208
විද්‍යුත් තැපැල - gcealexam@gmail.com

**ජේ.කේ.එස්.ඉන්දිකා කුමාරි ලියනගේ**
විභාග කොමසාරිස් ජනරාල්